ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

පණිවුඩය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සිය 153 වන සංවත්සරය සමරන අවස්ථාවට සමගාමීව යෙදී ඇති ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජීය දිනය (WTISD) වෙනුවෙන් මාගේ සුබපැතුම් පිරිනමමි.

මෙවර තේමාව වන "සැමට කෘතිම බුද්ධියේ යහපත් භාවිතය" කාලීන මෙන්ම අර්ථානුරූපී වන අතරම සාමාජික රටවල් විසින් WTISD පිළිබඳව ප්‍රජාවන් දැනුවත් කිරීම සඳහා පියවර ගෙන තිබීම පැසසුම් කටයුතුය.

මේ වනවිට කෘතිම බුද්ධිය සියලුම අංශවලට සම්බන්ධ වී ඇති අතර, පුද්ගල දිවි පෙවෙත වඩාත් සාර්ථක කිරීම සඳහා සෞඛ්‍ය සේවය, අධ්‍යාපන, මූල්‍ය, කෘෂිකර්ම, ප්‍රවාහන සහ තවත් පුළුල් සේවාවන්හි මූලික අංගයක් ලෙස කෘතිම බුද්ධිය පදනම් කරගත් තාක්ෂණවේදයන් ක්‍රියාත්මක වේ.

අපගේ සංවර්ධනය වඩාත් වැඩිදියුණු කිරීම සඳහා අප වඩාත් බලපෑම්සහගත වූ ක්‍රමවේද සොයාගත යුතු අතර, සෑම ක්ෂේත්‍රයකම කෘතිම බුද්ධිය ප්‍රයෝජනයට ගැනීමේ මාර්ග සොයාගත යුතුය. තිරසර සංවර්ධන අරමුණු හඳුන්වාදීම සඳහා වූ අපගේ ප්‍රයත්නය ජනකේන්ද්‍රීය විය යුතු අතර, සමස්ත ජාතික ප්‍රතිපත්ති සංයෝජනය කරමින් ශ්‍රී ලංකාවේ රජය තිරසර සංවර්ධනය සඳහා වූ අමාත්‍යාංශ පිහිටුවා ඇත. තවද, පරිසර හිතකාමී බව සහ තිරසරබව රකිමින් සමුද්‍රීය සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් ස්වාභාවික සම්පත්වල සම්පූර්ණ උපයෝගීතාවය සහතික කිරීම සඳහා නීලහරිත සමුද්‍රීය සැලැස්මක් දියත් කොට ඇත. මෙම ආර්ථික උපායමාර්ගය හරහා යහපත් ක්‍රමවේද අනුගමනය කරන්නාවූ ප්‍රගතිශීලී සංකේතයක් බවට පත්වීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි.

මා මෙහිදී මාගේ ශුභාශිංසන ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය වෙත පිරිනමන අතර, එහි අනාගත ප්‍රයත්නයන් සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරමි.

මෛත්‍රීපාල සිරිසේන

2018 මැයි මස 01 වැනි දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka